කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2012

2015 පෙබරවාරි

**BCOME 4015** - උපාය මාර්ගික කළමනාකරණය

ප්‍රශ්න සංඛ්‍යාව - හතයි (07) කාලය - පැය තුනයි (03)

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. ඉගෙනුම් සංවිධානයක් (learning organization) යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද ?

(ලකුණු 05)

ආ. ඉගෙනුම් සංවිධානයක් නිපුනතාවයක් දක්වන ප්‍රධාන කාර්යයන් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. " ගෝලීයකරණය හා පරිසර තිරසර තාවය (sustainability) උපාය මාර්ගික කළමනාකරණයට ප්‍රධාන අභියෝග වෙමින් පවතී. මෙම ප්‍රකාශය සුදුසු උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. අ. ඔබ කැමති ඕනෑම කර්මාන්තයක් තෝරා ගෙන එම කර්මාන්තයේ සාර්ව පරිසරයේ ස්වභාවය විස්තර කරන්වන. PESTEL ආකෘතිය භාවිතා කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කර එම සාධක සංවිධානයේ තරඟකාරිත්වයට කෙසේ බලපාන්නේද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ. සමාගමක උපායමාර්ගික සංධානයක් සාර්ථක වීම සඳහා පැවතිය යුතු සාධක විවේචනාත්මකව ඇගයීමකට ලක් කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. අ. " උපාය මාර්ග නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම නිසා බොහෝ විට අසාර්ථක වේ." උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ඉතා වැදගත් සංරචක සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ. " ආයතනයක උපායමාර්ගික දිශානතිය තීරණය කිරීමේදී උපායමාර්ගික නායකත්වය ඉතා වැදගත් වේ." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද ? ඔබේ පිළිතුර සුදුසු උදාහරණ සමගින් සනාථ කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04. අ. යහපත් ලෙස උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමේදී ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල කාර්ය භාරය සුදුසු උදාහරණ සමගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. සංවිධාන නිර්මාණය කිරීමේ ප්‍රධාන උපනතීන් මොනවාද ? ඒවා කළමනාකරණය කෙරෙහි බලපාන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. අ. උපාය මාර්ගික කළමනාකරණ ක්‍රියාවලියේ මූලිකාංග කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 07)

ආ. උපායමාර්ග වෙනස් වීම කෙරෙහි බලපාන සිද්ධීන් පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඇ. සී/ස ග්‍රීන් වැකේෂන්ස් (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුළු පරිමාණ සංචාරක නියෝජිත ආයතනයකි. ඔවුන් දේශීය හා විදේශීය සංචාරකයන්ට ලංකාව තුල හා වෙනත් රටවලට පැකේජයන් අලෙවි කරයි. මීට අමතරව, ලෝකයේ සියළුම රටවල් සඳහා ගුවන් ප්‍රවේශපත්‍ර අලෙවි කරයි. අනාගතයේදී ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු ඉතා වේගයෙන් වර්ධනය වේ යැයි ඔවුන් අපේක්ෂා කරයි. මීට ප්‍රධාන හේතුව වන්නේ අනාගතයේ ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ගේ ශීඝ්‍ර වර්ධනයක් වේ යැයි අපේක්ෂා කිරීමයි.

ග්‍රීන් වැකේෂන්ස් (පුද්ගලික) සමාගම සඳහා සාංගමික අරමුණු 06 ක් සකස් කරන්න. ( ඔබේ උපකල්පන දක්වන්න.)

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

06. ඔබ කැමති ඕනෑම කර්මාන්තයක් තෝරා ගෙන පෝටර්ගේ පංච බලවේග ආකෘතිය භාවිතා කරමින් එම කර්මාන්තයේ තරඟකාරීත්වයේ ස්වභාවය අගයන්න.

(මුළු ලකුණු 20)

07. පහත සඳහන් ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ. නීල සයුරු උපායමාර්ග (Blue Ocean Strategy)

(ලකුණු 05)

ආ. යහපත් උපායමාර්ගයන්හි මූලිකාංග

(ලකුණු 05)

ඇ. තුලිත ලකුණු පත්‍රය (Balanced Scorecard)

(ලකුණු 05)

ඉ. ශ්‍රීතික උපායමාර්ග

(ලකුණු 05)

(මුළු ලකුණු 20)